# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 13,200 — 1962 ජූලි 6 වැනි සිකුරාද — 1962.7.6**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවිකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ආදිය ... ... | — | ආණ්ඩුවේ නිවේදන ... ... ... | 1025 |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය ... | 1021 | මිළ පාලන දැන්වීම් ... ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | — | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය | 1023 | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| වෙනත් පත් කිරීම් ආදිය ... ... ... | 1024 | ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... ... | 1024 | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 1026 |
| | | "සරාබද ආඥපනත" පිළිබඳ දැන්වීම් ... ... | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය

1962 අංක 264

අංකය : ඩී.31/රෙක් ව/1.

### යුද්ධ හමුදාව—නිත්‍ය භට සේනාව—අග්‍රාණ්ඩුකාරතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් ඇති දිනයන්හි සිට කපිතාන් තනතුරට උසස් කරන ලදී:—

ලුතිනන් (තාවකාලික කපිතාන්) ජෝසප් එවරාඩ් ඩෙනිස් පෙරේරා, ල. ඉ. 1957 නොවැම්බර් 1 දින.

ලුතිනන් (තාවකාලික කපිතාන්) ලෝරන්ස් ජස්ටින් ඉග්නේෂස් ප්‍රනාන්දු, ල. ස. බ. 1957 නොවැම්බර් 1 දින.

ලුතිනන් (තාවකාලික කපිතාන්) බැස්චියන් කෝරලලාගේ වික්ටර් ජස්ටස් එතල්රඩ් රුද්‍රිගු, ල. කා. හ. 1957 නොවැම්බර් 1 දින.

ලුතිනන් (තාවකාලික කපිතාන්) තිස්ස ඉන්ද්‍රක වීරතුංග, ල. පා. හ. 1957 නොවැම්බර් 1 දින.

ලුතිනන් (තාවකාලික කපිතාන්) කලවිටගොඩගේ ජේම්ස් ටෙ ස්පෝ නොයල් ගුණවර්ධන, ල. පා. හ. 1957 නොවැම්බර් 1 දින.

ලුතිනන් (තාවකාලික කපිතාන්) ඩෝල්ටන් මෙල්රෝයි කැමියන් ඇන්ඩර්සන්, ල. පා. හ. 1957 නොවැම්බර් 1 දින.

ලුතිනන් (තාවකාලික කපිතාන්) වල්ලිපුරම් රාමනාදන්, ල. කා. හ. 1957 නොවැම්බර් 1 දින.

ලුතිනන් (තාවකාලික කපිතාන්) ගොඩ්ෆ්‍රි ජෝයි කාල්ටන් අබේවික්‍රම ගුණතිලක, ල. ඉ. 1957 නොවැම්බර් 1 දින.

ලුතිනන් (තාවකාලික කපිතාන්) දුලිප් ජස්ටින් ද සිල්වා වික්‍රමනායක, ල. කා. හ. 1957 නොවැම්බර් 1 දින.

ලුතිනන් (තාවකාලික කපිතාන්) සෝමවීර ඩෙනිස්ටර් නානායක්කාරවසම් හපුගල, ල. ස. ස. බ. 1957 නොවැම්බර් 1 දින.

ලුතිනන් (තාවකාලික කපිතාන්) සුගතපාල සිරිල් රණතුංග, ල. ස. ස. බ. 1957 නොවැම්බර් 1 දින.

ලුතිනන් (තාවකාලික කපිතාන්) මිල්ටන් පැට්රික් කරුණාරත්න, ල. ඉ. 1957 නොවැම්බර් 1 දින.

ලුතිනන් (තාවකාලික කපිතාන්) ප්‍රැන්සිස් සෝමරත්න කස්තුරිආරච්චි, ල. යු. පො. සේ. බ. 1957 නොවැම්බර් 1 දින.

ලුතිනන් (තාවකාලික කපිතාන්) පරම් සෙල්වරාජා, ල. යු. පො. සේ. බ. 1957 නොවැම්බර් 1 දින.

### විශෙෂ නිවේදනයයි

නිෂ්පාදන වියදම් අධිකවීමේ හේතුන් නිසා ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළකිරීමේ ගාස්තු වැඩි කිරීමට තීරණය කර ඇත. දැනට පවතින පළමුවන අඟලට රු. 10 ක් සහ වැඩිවන සෑම අඟලක් සඳහා රු. 5 බැගින් අයකරනු ලබන ගාස්තුව වෙනුවට, 1962 ජූලි මස 16 වෙනි දින සිට වෙළඳ ලකුණු දැන්වීම් හැර අන් සියළුම දැන්වීම් සඳහා නව තීරුවේ සෑම අඟලකට හෝ ඉන් කොටසකට රු. 10 බැගින්ම අයකරනු ලබන බව සෑම දෙනාගේම දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1962, ජූනි මස 29 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

ලුතිනන් (තාවකාලික කපිතන්) ඒඩ්‍රියන් ඩේවිඩ් මොරිස් රේමන් ඩී, ල. පා. හ. 1957 නොවැම්බර් 1 දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) නාගලිංගම් අම්ර්තලිංගම්, ල. පා. හ. 1957 නොවැම්බර් 1 දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) මන්තිනාථ රණවක, ල. ඉ. 1957 නොවැම්බර් 1 දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) සුමන බණ්ඩා මීයනදෙනිය, ල. පා. හ. 1957 නොවැම්බර් 1 දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) පොලිකාප් කෙනත් බ්‍රින්ඩ්ස්ලි පෙරෙයිරා යු. හ. සේ. බ. 1957 නොවැම්බර් 1 දින

ලුතිනන් (තාවකාලික කපිතන්) හෙන්රි විජය අතුකෝරාල, ල. පා. හ. 1957 නොවැම්බර් 1 දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) මනෝහර් මඩවල, ල. පා. හ. 1957 නොවැම්බර් 1 දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) පිලිප් ආතර් තියඩෝර් කෙලී, ල. කා. හ. 1957 නොවැම්බර් 1 දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) අබ්දුල් මජීඩ් මොහමඩ් පරීඩ්, ල. සං. බ. 1957 නොවැම්බර් 1 දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) දෙන් ජෙරෝම් ක්‍රිස්ටෝපර් රණසිංහ, ල. යු. යු. බ. 1957 නොවැම්බර් 1 දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) ගොඩ්වින් වෝල්ටර් හොක්මන්, ල. යු. යු. බ. 1957 නොවැම්බර් 1 දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) ප්‍රැන්සිස් පෝල් චැප්මන්, ල. පා. හ. 1957 නොවැම්බර් 1 දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) ජෝසප් පිලිප් ඇන්ඩෘ ප්‍රනාන්දු, ල. වි. යා. ඉ. 1958 ඔක්තෝබර් 1 දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) ගනේගොඩ දෙන් ග්‍රැන්විල් නාලින් සෙනෙවිරත්න, ල. ඉ. 1958 ඔක්තෝබර් 1 දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) එලියතම්බි ජෝර්ජ් තේවනායගම්, ල. සි. රෙ. 1958 ඔක්තෝබර් 1 දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) ස්ටැන්ලි ක්ලිපර්ඩ් රෝල්ස්, ල. පා. හ. 1958 ඔක්තෝබර් 1 දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) ආරියරත්නම් විල්ප්‍රඩ් යෝගරාජා, ල. කා. හ. 1958 ඔක්තෝබර් 1 දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) මොන්ටේගු සිල්වරියස් සමරවීර, ල. පා. හ. 1958 ඔක්තෝබර් 1 දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) ජෙරෝම් ගොතියේ බල්තසාර්, ල. පා. හ. 1958 ඔක්තෝබර් 1 දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) කැලයිල් ෆ්‍රිට්ස්රෝයි විලියම් පෙරේරා, යු. හ. සේ. බ. 1958 ඔක්තෝබර් 1 දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) ජෝර්ජ් ඩොමිංගෝ ප්‍රනාන්දු, ල. කා. හ. 1958 ඔක්තෝබර් 1 දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) යාපාවත්තකු රාජපක්ෂ මුදියාන්සෙලාගේ පර්සි විජේකෝන්, ල. කා. හ. 1958 ඔක්තෝබර් 1 දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) මැතිව් ජෝර්ජ්, ල. ස. ස. බ. 1958 ඔක්තෝබර් 1 දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) රාජසිංහලාගේ විජේසිංහ, ල. යු. පො. සේ. බ. 1958 ඔක්තෝබර් 1 දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) රාමලිංගම් හරින්ද්‍රන්, ල. කා. හ. 1959 ඔක්තෝබර් 1 දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) කලගේ ආචාරි මෙස්රිගේ නන්ද සිල්වා, ල. පා. හ. 1959 ඔක්තෝබර් 1 දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) තුවන් අන්වාර් බූල්, ල. සි. රෙ. 1959 ඔක්තෝබර් 1 දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) සහර්ඩීන් මූසාපර්, ල. හ. සේ. බ. 1960 පෙබරවාරි 25 දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) ගික්කඩුවගේ ග්‍රේෂියන් සිල්වා, ල. කා. හ. 1960 පෙබරවාරි 25 දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) එරික් එඩ්වර්ඩ් පත්මනාදන් ජෝසප්, ල. පා. හ. 1960 පෙබරවාරි 25 දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) ආරියජෝති විල්මට් තම්බිරාජා, ල. පා. හ. 1960 පෙබරවාරි 25 දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) දුලිප් සිං උපවංස වීරසිංහ, ල. කා. හ. 1960 අප්‍රේල් 1 දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) සිඩ්නි විජයරත්න, ල. කා. හ. 1960 අප්‍රේල් 1 දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) නානායක්කාරගේ දෙන් හර්මන් ඇන්තනි බර්නාඩ් සිල්වා, ල. පා. හ. 1960 අප්‍රේල් 1 දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) රත්නසභාපති මහෙන්ද්‍රන්, ල. පා. හ. 1960 අප්‍රේල් 1 දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) මාලවිගේ දුතියසේන ප්‍රනාන්දු, ල. ස. ස. බ. 1961 සැප්තැම්බර් 15 දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) ඇන්ටන් ජේසුරාජ් තෙවීන්ස් සෙල්වදුරෙයි, ල. ස. ස. බ. 1961 සැප්තැම්බර් 15 දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) ප්‍රසන්න ගුණසීලු සේපාල පණ්ඩිත දහනායක, ල. සි. රෙ. 1961 සැප්තැම්බර් 15 දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) මාක් ඇන්තනි පෙරේරා සමරසිංහ, ල. පා. හ. 1961 සැප්තැම්බර් 15 දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) පෙඩ්රික් වින්ස්ටන්. ඇන්තනි ඩයස්, ල. හේ. පො. බ. 1961 සැප්තැම්බර් 15 දින.

ලුතිනන් (තාවකාලික කපිතන්) කසීම් ඉස්මයිල් මොහමඩ් තවුපික් ඩීන්, ල. යු. සේ. බ. 1961 සැප්තැම්බර් 15 දින.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. කෲ. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 ජූනි 25 වෙනිදා,
කොළඹ දීය.

7—206

---

1962 අංක 265

අංකය : ඞී/වී.එෆ්/17 ඒ.

## යුධ හමුදාව—ලංකා ස්වේච්ඡා බලසේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද අධිකාර පත්‍ර ලත් ධුරවලට පත්කිරීම් හා ද්විතීයනය කිරීම්

### පත්කිරීම්

පහත සඳහන් පරිදි ජ්‍යෙෂ්ඨත්වය ඇතිව, 1962 මාර්තු 1 වැනි දින සිට ලංකා ශිෂ්‍ය භට බලකායේ උප ලුතිනන්වරුන් වශයෙන් :—

ඥාතිය බණ්ඩාර විජේසිංහ මහතා.

රාජපක්ෂ මැනික්කුනම්බි තිලකසේන නෙල්සන් මැන්දිස් මහතා.

කතිසින් විමලජීව අමන්දකෝන් මහතා.

මතේස් කන්කානන්ගේ සත්‍යපාල ජයසේකර මහතා.

වන්නි ආරච්චිගේ වික්‍රමසේන මහතා.

සිරිල් වීරකෝන් මහතා.

දිසානායක මුදියන්සේලාගේ බන්නෙක්ගෙදර එඩ්වර්ඩ් දිසානායක මහතා.

ඇන්තනි ගොඩ්ෆ්‍රි මායාදුන්න මහතා.

කපුගෙදර සෝමසිංහ මහතා.

ධම්ජීව සමරනායක ජයවර්ධන මහතා.

පර්සි ඇල්බර්ට් වීරකෝන් මහතා.

### ද්විතීයනය කිරීම්

ලංකා ශිෂ්‍ය භට බලකායේ පහත නම් සඳහන් නිලධාරීන් 1962 මාර්තු 1 වැනි දින සිට කණිෂ්ඨ කොටසේ සේවය සඳහා ද්විතීයනය කොට තිබේ :—

උප ලුතිනන් ඥාතිය බණ්ඩාර විජේසිංහ.

උප ලුතිනන් රාජපක්ෂ මැනික්කුනම්බි තිලකසේන නෙල්සන් මැන්දිස්.

උප ලුතිනන් කතිසින් විමලජීව අමන්දකෝන්.

උප ලුතිනන් මතේස් කන්කානන්ගේ සත්‍යපාල ජයසේකර.

උප ලුතිනන් වන්නි ආරච්චිගේ වික්‍රමසේන.

උප ලුතිනන් සිරිල් වීරකෝන්.

උප ලුතිනන් දිසානායක මුදියන්සේලාගේ බන්නෙක්ගෙදර එඩ්වර්ඩ් දිසානායක.

උප ලුතිනන් ඇන්තනි ගොඩ්ෆ්‍රි මායාදුන්න.

උප ලුතිනන් කපුගෙදර සෝමසිංහ.

උප ලුතිනන් ධම්ජීව සමරනායක ජයවර්ධන.

උප ලුතිනන් පර්සි ඇල්බර්ට් වීරකෝන්.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. කෲ. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 ජූනි 25 වෙනිදා,
කොළඹ දී ය.

7-81

1962 අංක 266

අංකය : ඕ/විඑප්/16/ඒ.

## යුද්ධ හමුදාව—ලංකා සෙවච්ඡා බලසේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් භාරගන්නා ලද ඉල්ලා අස්වීම්

සවදේශාරක්ෂක රෙජිමේන්තුවේ, ලුතිනන් ෂෙලී ඉවෝල්ඩ් ප්‍රනාන්දු හා උප ලුතිනන් ප්‍රැන්සිස් එරික් තියඩෝර් පොනාන්ඩර් ඔවුන්ගේ අධිකාර ලත් ධුරවලින්, පිළිවෙලින් 1962.5.7 හා 1961.9.1 වැනි දිනයන්හි සිට අස්වීමේ ඉල්ලීම් අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් භාරගෙන තිබේ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. කෲ. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1962 ජූනි 25 වෙනිදා,
කොළඹ දී ය.
7-80

---

1962 අංක 267

අංකය : ඕ.42/රෙක් වි.

## නිලධාරීන් පත්කිරීම්—රාජකීය ලංකා නාවික හමුදාව

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් රාජකීය ලංකා නාවික හමුදාවේ පහත සඳහන් පත්කිරීම අනුමත කර තිබේ :—

1962 ජූනි 1 වැනි දින සිට රා. ව. ලං. කොටියා නෞකාවේ අණදෙන නිලධාරි වශයෙන් :—

ලයිතන් එච්. ඒ. සිල්වා, රා. ලං. නා. හ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. කෲ. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 ජූනි 25 වෙනිදා,
කොළඹ දීය.
7—147

---

# අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

1962 අංක 268

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත්කිරීම් කර ඇත්තේ ය :—

අංකය : ජේඒ. 11/48.

ඕ. එල්. ද ක්‍රෙට්සර් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 ජූනි 22 වැනි දින සිට, කොළඹ දිස්ත්‍රික් උසාවියේ අංක. 903/ඉසැඩිඑල් සහ 1265/ඊ දරණ නඩු අවසාන වනතුරු ඇහීමට හා තීන්දු දීමට හා කොළඹ දිස්ත්‍රික් උසාවියේ අංක 7857/පී දරණ නඩුවේ තීන්දුව දීමට කොළඹ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒ. 50/48.

වී. එම්. කුමාරසාමි මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 ජූලි 11 වැනි දින සිට, චාවාකච්චේරියේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක. 16093 දරණ නඩුව අවසාන වන තුරු ඇහීමට හා තීන්දුව දීමට, චාවාකච්චේරියේ පිහිටි උසාවියේ ක්‍රියා කරණ පිණිස, පේදුරුතුඩුවේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා පේදුරුතුඩුවේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒ. 37/48.

ජේ. ජේ. එෆ්. ඒ. ඩයස් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 ජූනි 21 වැනි දින සිට, කුලියාපිටියේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක. 8657, 10800, 10973, 11442, 11523, 12439, 14370, 10233 සහ 11318 දරණ නඩුවල තීන්දු දීමට හා කුලියාපිටියේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක. 6050 සහ 13251 දරණ නඩු අවසාන වන තුරු ඇහීමට හා තීන්දු දීමට හා 1962 ජූනි 27 වැනි දින සිට, කුලියාපිටියේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක. 13966 දරණ නඩුවේ තීන්දුව දීමට හා 1962 ජූලි 6 වැනි දින සිට, කුලියාපිටියේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක. 12664 දරණ නඩුව අවසාන වන තුරු ඇහීමට හා තීන්දුව දීමට, (කුලියාපිටියේ පලාත් ආණ්ඩු සභාව පිහිටි සීමාව තුල) කනදුල්ලේ පිහිටි උසාවියේ, කුරුණෑගල, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා (කුලියාපිටියේ පලාත් ආණ්ඩු සභාව පිහිටි සීමාව තුළ) කනදුල්ලේ පිහිටි උසාවියේ, කුරුණෑගල, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේ.එල්. 57ඒ/57.

කේ. ඩී. ඕ. එස්. එම්. සෙනෙවිරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එම්. ඩබ්ලිව්. ආර්. ද සිල්වා මහතා 1962 ජූනි 23 වැනි දින සිට 26 වැනි දින දක්වා, ගම්පොල පිහිටි උසාවියේ ක්‍රියා කරන පිණිස, මහනුවර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා ගම්පොල, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 40ඒ/60.

සී. එල්. ටී. මූනමලේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. අමරසිංහ මහතා 1962 ජූනි 30 වැනි දින සහ 1962 ජූලි 1 වැනි දිනද, හම්බන්තොට, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමස රිස් ධුරයට, තංගල්ලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා තංගල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 68,සී/51.

සී. වී. උදලාගම මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එච්. ඒ. ජයවික්‍රම මහතා 1962 ජූලි 1 වැනි හා 2 වැනි දින යන්හි, අනුරාධපුරේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, අනුරාධපුරේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මන්නාරමේ හා වවුනියාවේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, වවුනියාවේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට, ත්‍රිකුණාමලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා ත්‍රිකුණාමලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 34ඒ/48.

එස්. එස්. කුලතිලක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ටී. ආසීර්වාදම් මහතා 1962 ජූලි 5 වැනි දින සිට 7 වැනි දින දක්වා, රත්නපුරේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා රත්නපුරේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 68ඩී/53.

ඒ. වෛත්‍යලිංගම් මහතා නැවත වැඩ බාරගන්නා තුරු හෝ නැවත නියමයක් කරන තුරු, වී. කනගසබේ මහතා 1962 ජූනි 28 වැනි දින සිට, පේදුරුතුඩුවේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා පේදුරුතුඩුවේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 35බී/61.

ඩී. ඩබ්ලිව්. කේ. ලද්දුවහෙට්ටි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. එන්. සී. තිරුචෙල්වම් මහතා 1962 ජූනි 26 වැනි හා 28 වැනි දිනයන්හි, කොළඹ, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, හා කොළඹ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 57ඒ/57.

කේ. ඩී. ඕ. එස්. එම්. සෙනෙවිරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. එම්. අයි. ගුණරත්න මහතා 1962 ජූනි 30 වැනි දින සිට 1962 ජූලි 4 වැනි දින දක්වා, ගම්පොල පිහිටි උසාවියේ ක්‍රියා කරණ පිණිස, මහනුවර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා ගම්පොල, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 54ඒ/54.

ටී. ජේ. රාජරත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. එච්. උදලාගම මහතා 1962 ජූලි 5 වැනි දින සිට 7 වැනි දින දක්වා, කෑගල්ලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා කෑගල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 7ඒ/51(ඒ).

ඒ. ඕ. එස්. දිසානායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. පී. විජේතිලක මහතා 1962 ජූලි 6 වැනි දින සිට 9 වැනි දින දක්වා, මාතලේ පිහිටි උසාවියේ ක්‍රියා කරණ පිණිස, මහනුවර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා මාතලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 12ඒ/57.

කේ. සී. ඊ. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එන්. එම්. ඒ. වික්‍රමසූරිය මහතා 1962 ජූලි 7 වැනි දින සිට 11 වැනි දින දක්වා, තංගල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, තංගල්ලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා හම්බන්තොට, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 41ඒ/60.

එස්. ජේ. එම්. ජී. එස්. මුදන්නායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඩබ්ලිව්. ද සිල්වා මහතා 1962 ජූලි 6 වැනි, 7 වැනි හා 9 වැනි දිනයන්හි, කළුතර අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා කළුතර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 63බී/61.

ජේ. සේනාතිරාජා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, වී. එම්. ගුරුසාමි මහතා 1962 ජූලි 6 වැනි දින, මහනුවර, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මහනුවර, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, දුම්බර, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා මහනුවර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 23ඒ/58.

ඒ. ඩබ්ලිව්. ගුණරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඞී. ඒ. ඊ. මීගම මහතා 1962 ජූලි 7 වැනි දින සිට 10 වැනි දින දක්වා, පානදුරේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා. පානදුරේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 1ඒ/48.

පී. එස්. ඩබ්ලිව්. අබේවර්ධන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, වී. කුමාරසාමි මහතා 1962 ජූලි 1 වැනි දින සිට 4 වැනි දින දක්වා, මහනුවර, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මහනුවර, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, දුම්බර, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා මාතලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 29සී/61.

එම්. ජමීල් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. එන්. සී. තිරුචෙල්වම් මහතා 1962 ජූලි 2 වැනි දින, කොළඹ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට, හා කොළඹ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : සී/ජේ.ආර්ඒ. 1/62.

එම්. සලහුදින් මහතා දිවයිනේ ගම්බද උසාවි සභාපතිවරයකු වශයෙන් හා 1962 ජූනි 18 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, උතුරු මැද පළාතේ ආදායම් පාලක නිලධාරිතැනගේ කොට්ඨාශවල හා කුරුණෑගල ආදායම් දිස්ත්‍රික්කයේ, හා පුත්තලම් දිස්ත්‍රික්කයේ, පුත්තලම් පත්තුවේ, දෙමළ හත්පත්තුවේ හා කල්පිටිය ආදායම් පාලක නිලධාරිතැනගේ කොට්ඨාශයේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයට.

අංකය : සී/ජේ.ආර්.ඒ. 1/62.

සී. ජී. එල්. ද අල්විස් මහතා දිවයිනේ ගම්බද උසාවි සභාපතිවරයකු වශයෙන් හා 1962 ජූනි 18 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ පත්තුවේ, කඩවත් සතරේ හා වැලිගම් කෝරලේ ගම්බද උසාවි සභාපති ධුරයට හා ගඟබොඩ පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයට.

අංකය : සී/ජේ.ආර්.ඒ. 1/62.

ඒ. අතපත්තු මහතා දිවයිනේ ගම්බද උසාවි සභාපතිවරයකු වශයෙන් හා 1962 ජූනි 18 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, බදුල්ල දිස්ත්‍රික්කයේ, යටිකිඳ-වියලුව ගම්බද උසාවි සභාපති ධුරයට හා බුත්තල ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයට.

අංකය : සී/ජේ.ආර්.ඒ. 1/62.

පී. එම්. සෙනෙවිරත්න මහතා දිවයිනේ ගම්බද උසාවි සභාපතිවරයකු වශයෙන් හා 1962 ජූනි 18 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, උතුරු සහ දකුණු හුරුළුපලාතේ ගම්බද උසාවි සභාපති ධුරයට හා, කලාගම් පලාතේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයට.

අංකය : සී/ජේ.ආර්.ඒ. 1/62.

සී. ඒ. එස්. ඊ. ක්‍රිස්පින් මහතා දිවයිනේ ගම්බද උසාවි සභාපතිවරයකු වශයෙන් හා 1962 ජූනි 18 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වන්නි හත්පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයට හා හිරියාල හත්පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයට.

අංකය : පීඑල්/පී. 6/51.

එස්. ජී. පීරිස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඊ. ගුණසේකර මහතා 1962 ජූනි 28 වැනි දින, මාතර දිස්ත්‍රික්කයේ මොරවක් කෝරලේ ගම්බද උසාවි සභාපති ධුරයේ හා වැලිගම් කෝරලේ සහ ගඟබොඩ පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඊ. 4/59.

ඩී. බී. ඇල්ලේපොල මහතා නැති අතර, පී. ශ්‍රී පත්මනාදන් මහතා 1962 ජූනි 25 වැනි දින, බදුල්ල දිස්ත්‍රික්කයේ වෙල්ලස්ස-බින්තැන්න හා බුත්තල ගම්බද උසාවි සභාපති ධුරයේ හා යටිකිඳ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/එම්. 5/54.

ඊ. එම්. මතියපරනාම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, පී. වී. සේනාතිරාජා මහතා 1962 ජූලි 6 වැනි, 7 වැනි හා 9 වැනි දිනයන්හි, වවුනියාවේ හා මන්නාරම් දිස්ත්‍රික්කවල දකුණු වවුනියාවේ ගම්බද උසාවි සභාපති ධුරයේ හා මාන්තෙයි ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/එන්. 2/57.

කේ. වී. නවරත්නම් මහතා නැති අතර, එස්. සභාපතිපිල්ලේ මහතා 1962 ජූනි 27 වැනි දින, පේදුරුතුඩුව දිස්ත්‍රික්කයේ, තැන්මරච්චි, පච්චිලෙයිපිල්ලෙයි-කරච්චි, පූනකාරි-තුනුකායි ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඒ. 9/61.

ඒ. එම්. එම්. අලහුදින් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, පී. කුමාරනායගම් මහතා 1962 ජූලි 5 වැනි දින සිට 7 වැනි දින දක්වා, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කොඩ්ඩියාර් පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයේ හා කඩ්ඩුකුලම් හා තම්පලකාමම් පත්තුවල ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

ඇන්. ඒ. ද ඇස්. විජේසේකර,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 ජූනි 29 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංකය-573,
කොළඹ-12.

7-109

## වෙනත් පත් කිරීම් ආදිය

1962 අංක 269

අංකය. ජේ. 12/60.

1944 අංක 13 දරණ ආඥපනතින් සහ 1948 පෙබරවාරි මස 5 වෙනි දින අංක. 9828 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පලකරණ ලද 1948 පෙබරවාරි මස 4 වෙනි දින දරණ ප්‍රකාශනයෙන් සංශෝධිත, 1939 අංක 48 දරණ ළමයින් සහ තරුණ අය පිළිබඳ ආඥපනතේ 3 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ ඇමතිතුමා විසින්—

1962 ජූනි මස 1 වෙනි දින සිට ඇස්. ජේ. ඇම්. ජී. ඇස්. මුදන්නායක මහතා එම මහතාගේ අනිකුත් රාජකාරිවලට අතිරේක වශයෙන් කළුතර අධිකරණ කොට්ඨාශයෙහි ළමා මහෙස්ත්‍රාත්වරයා ලෙස පත්කර ඇත්තේ ය.

1962, ජූනි මස 29 වැනි දින.
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

7—131

1962 අංක 270

දෙන් දයානන්ද නලින් කුමාර අබේනායක මහතා කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි සහ සිංහල භාෂාවන්ගෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු අමාත්‍යතුමා විසින් පත්කර තිබේ.

කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 ජූනි මස 20 වැනි දින,
කොළඹ දී ය.

7-20

## රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය

1962 අංක 271

### රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

මෙහි පහත සඳහන් පත්කිරීම් ම විසින් නියම කර ඇත්තේ ය:

1. රෙජිස්ට්‍රාර් සේවයේ I ශ්‍රේණියේ රෙජිස්ට්‍රාර් තැන්පත් පී. ඒ. ඕ. පී. විජේසිංහ මහතා කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සේවය කරමින් කොළඹ පාලන දිස්ත්‍රික්කයෙහි ඉඩම් රෙජිස්ට්‍රාර් වශයෙන් 1962. 6. 18 දින සිට.

2. රෙජිස්ට්‍රාර් සේවයේ II ශ්‍රේණියේ රෙජිස්ට්‍රාර් තැන්පත් කේ. ඒ. එන්. කේ. විජයවර්ධන මහතා මහනුවර ඉඩම් සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සේවය කරමින් මහනුවර පාලන දිස්ත්‍රික්කයෙහි ඉඩම් රෙජිස්ට්‍රාර් සහ අතිරේක දිස්ත්‍රික් ලේකම් වශයෙන් 1962. 6. 15 දින සිට.

3. රෙජිස්ට්‍රාර් සේවයේ II ශ්‍රේණියේ රෙජිස්ට්‍රාර් තැන්පත් පී. ඩී. කුලසේන මහතා කළුතර ඉඩම් සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සේවය කරමින් කළුතර පාලන දිස්ත්‍රික්කයෙහි ඉඩම් රෙජිස්ට්‍රාර් සහ අතිරේක දිස්ත්‍රික් ලේකම් වශයෙන් 1962. 6. 13 දින සිට.

ඒ. එම්. එස්. පෙරේරා,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය,
කොළඹ 1, 4 ජූනි, 1962.

7-11

---

# ආණ්ඩුවේ නිවේදන

## වැලිකඩ සහ මැගසින් බන්ධනාගාරබද ප්‍රාදේශීය පරීක්ෂණ මණ්ඩලය

### කෙටුම්පත

අංක 12,797 දරණ 1961 දෙසැම්බර් මස 8 වෙනි දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ වූ නිවේදනයෙන්, වැලිකඩ සහ මැගසින් බන්ධනාගාරයන්හි ප්‍රාදේශීය පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් පත් කරන ලද ඇම්. හලීම් ඉසාක් මහතා එම ධුරයෙන් ඉල්ලා අස්වීම 1962 මැයි මස 23 වෙනි දින සිට කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු භාර ඇමති තුමා විසින් පිළිගෙන ඇත.

කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික් කටයුතු
භාර අමාත්‍යාංශයේ සථිර ලේකම්
වෙනුවට.

කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු භාර
අමාත්‍යාංශය,
1962 ජූනි මස 27 වන දින.

7-49

---

ඇල්.ඩී.—බී. 22/59.

## 1959 අංක 6 දරන සේවක නිවාඩු පනත

වර්ෂ 1959 අංක 6 දරන සේවක නිවාඩු පනතේ 17 වගන්තියෙන් පැවරී ඇති බලතල පිට වැඩ බලන කම්කරු සහ ජනසතු සේවා ඇමැතිවරයා විසින් ඇති කරනු ලැබ උත්තර මන්ත්‍රී මණ්ඩලයෙන් සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයෙන් අනුමත වූ රෙගුලාසි යි.

සී. විජේසිංහ,
වැඩබලන කම්කරු සහ ජනසතු සේවා ඇමැති.

1961 පෙබරවාරි මස 1 වැනි දින,
කොළඹ, කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

### රෙගුලාසි

1. මේ රෙගුලාසි 1960 සේවක නිවාඩු රෙගුලාසි වශයෙන් හැඳින් විය හැකිය.

2. (1) පනතේ 3 වන හෝ 4 වන වගන්තිය යටතේ යම් සේවකයකුට නිවාඩු දිනයක් වශයෙන් දෙන ලද යම් කිසි දවසක් වෙනුවෙන් සේවයෝජකයා විසින් එම සේවකයාට ගෙවීමට බැඳී ඇති පාරිශ්‍රමිකය—

(අ) (i) සේවකයා සිය වැඩ සඳහා කාල මිම්මේ පාරිශ්‍රමිකයක් ගෙවනු ලැබීමට හිමිකම් ඇත්තෙක් වූ කල්හි, ඒ දවස නිවාඩු දිනයක් නො වූයේ නම් සහ එදිනට නියමිත වැඩ කිරීමේ සාමාන්‍ය කාලවේලා තුළ සේවකයා වැඩ කෙළේ නම් ඒ සේවකයාට හිමිකම් ලැබෙන්නට තුබුණු පාරිශ්‍රමිකයට අඩු නොවිය යුතුය ;

(ii) සේවකයා සිය වැඩ සඳහා කෑලි මිම්මේ පාරිශ්‍රමිකයන් ගෙවනු ලැබීමට හිමිකම් ඇත්තෙක් වූ කල්හි, එම දවස් යෙදෙන්නා වූ පාරිශ්‍රමික කාල පරිච්ඡේදය තුළ හෝ ඒ දවස යෙදෙන්නා වූ පාරිශ්‍රමික කාල පරිච්ඡේදය තුළ සේවකයා වැඩ කර නැත්තේ නම් ඊට පෙර අවසාන වරට ඒ සේවකයා වැඩ කර ඇති පාරිශ්‍රමික කාල පරිච්ඡේදය තුළ හෝ ඒ සේවකයා විසින් උපයන ලද පාරිශ්‍රමික මුදලේ සාමාන්‍යයට අඩු නොවිය යුතුය. සාමාන්‍යයය ලබා ගත යුත්තේ නියම වශයෙන් ම වැඩ කළ දින ගණනේ සම්පූර්ණ පාරිශ්‍රමික මුදල එම දින ගණනෙන් බෙදීමෙනි ; හෝ

(iii) සේවකයා සිය වැඩ සඳහා කාල මිම්ම අනුව ගණන් බැලූ මුදල හෝ කෑලි මිම්ම අනුව ගණන් බැලූ මුදල හෝ යන මේ දෙකෙන් වැඩි මුදල කුමක් ද ඒ මුදල ගෙවනු ලැබීමට හිමිකම් ඇත්තෙක් වූ කල්හි, එම දවස යෙදෙන්නාවූ පාරිශ්‍රමික කාල පරිච්ඡේදය තුළ හෝ ඒ දවස යෙදෙන්නාවූ පාරිශ්‍රමික කාල පරිච්ඡේදය තුළ සේවකයා වැඩ කර නැත්තේ නම් ඊට පෙර අවසාන වරට ඒ සේවකයා වැඩ කර ඇති පාරිශ්‍රමික කාල පරිච්ඡේදය තුළ හෝ ඒ සේවකයා විසින් උපයන ලද පාරිශ්‍රමික මුදලේ සාමාන්‍යයට අඩු නොවිය යුතුය. සාමාන්‍යය ලබාගත යුත්තේ නියම වශයෙන්ම වැඩ කළ දින ගණනේ සම්පූර්ණ පාරිශ්‍රමික මුදල එම දින ගණනින් බෙදීමෙනි.

(2) පනතේ 3 වන වගන්තිය හෝ 4 වන වගන්තිය යටතේ නිවාඩු දිනයක් වශයෙන් දෙන ලද්දාවූ යම් කිසි දවසක් වෙනුවෙන් ගෙවිය යුතු වන පාරිශ්‍රමිකය ඒ දිනය යෙදෙන්නාවූ පාරිශ්‍රමික කාල පරිච්ඡේදය සඳහා වූ පාරිශ්‍රමිකය සමග ගෙවිය යුතුය.

(3) මේ රෙගුලාසියේ කාර්යයන් සඳහා සේවකයකු සම්බන්ධයෙන් වූ පාරිශ්‍රමික කාල පරිච්ඡේදය—

(අ) එවැනි සේවකයකුගේ වැඩ සඳහා පාරිශ්‍රමිකය ගෙවීමේ කාල පරිච්ඡේදය නියම කර තබා ගැනීමට යම් ලිඛිත නීතියක විධිවිධානයකින් සේවයෝජකයාට නියමිතව ඇති කල්හි, එසේ වූ කාල පරිච්ඡේදය ද

(ආ) අන් කවර අවස්ථාවක දී වුවත් මාසයේ පළමුවන දිනින් පටන් ගෙන ඒ මාසයේ අවසාන දිනින් කෙළවර වන කාල පරිච්ඡේදය වන්නේ ය.

3. පනතේ 2 වන වගන්තිය යටතේ වූ නිවාඩු නියෝගයක් අදාල වන සේවකයන්ගේ සෑම සේවයෝජකයෙක් එම සේවකයන්ට නිවාඩු නියෝගය යටතේ දෙන ලද නිවාඩු දවස් ද එම නිවාඩු නියෝගයෙහි නියමිත සේවකයන් පිළිබඳ පන්තිය හෝ විස්තරය ද දක්වන දැන්වීමක් ඒ සේවකයන් සේවයෙහි යොදවාගෙන තිබෙන සථානයෙහි ප්‍රදර්ශනය කර තැබිය යුතුය.

4. යම් කිසි සේව යෝජකයකු යම් කිසි ලිඛිත නීතියක් යටතේ සවකීය සේවකයන්ගේ පාරිශ්‍රමිකය සහ වැඩ කරන කාලවේලාවන් පිළිබඳ යම් ලේඛනයක් හෝ සටහනක් පවත්වාගෙන යැමට නියමිතව සිටින කල්හි, පනතේ විධිවිධාන යටතේ සිය සේවකයන්ට දෙන ලද සෑම නිවාඩු දිනයක් පිළිබඳ විස්තර සහ එවැනි ඒ නිවාඩු දිනය වෙනුවෙන් ගෙවූ පාරිශ්‍රමික මුදලේ ප්‍රමාණය ද, නිවාඩු නියෝගයෙන් නිවාඩු දිනයක් හැටියට ප්‍රකාශයට පත් කොට ඇති යම් දවසක යම් සේවකයකු වැඩෙහි යොදවා ගැනීමට පනතේ 4 වන වගන්තියේ විධිවිධාන යටතේ කම්කරු කොමසාරිස්වරයා විසින් අවසර දී ඇත්තේ නම් සහ සේව යෝජකයා එම සේවකයාට ඒ නිවාඩු දිනය වෙනුවට වෙන නිවාඩු දිනයක් දී නැත්තේ නම්, එම නිවාඩු දිනයෙහි වැඩෙහි යෙදීම සඳහා ඒ සේවකයාට ගෙවන ලද පාරිශ්‍රමික මුදලේ ප්‍රමාණය ද එකී ලේඛනයට හෝ සටහනට ඇතුළත් කළ යුතුය.

5. පනතේ 7 වන වගන්තියේ කාර්යයන් සඳහා සෑම කම්කරු නිලධාරියෙක් නියමිත නිලධාරියෙක් වන්නේ ය.

6. පනතේ 10 වන වගන්තිය යටතේ කිරීමට නියමිතව ඇත්තාවූ සෑම දැන්වීමක් මෙයට යා කොට ඇති උපලේඛනයේ දැක්වෙන ආකෘතියට සාරානුකූල විය යුත්තේ ය.

7. සාමාන්‍යයෙන් දින ගණනට හෝ වැඩ ගණනට හෝ ගමන් ගණනට කරනු ලබන යම් කිසි වැඩක යොදවා ගනු ලබන්නා වූ සේවකයන් කෙරෙහි පනත අදාල නොවන්නේ ය.

8. මේ රෙගුලාසිවල "පනත" යන්නෙන් අදහස් කෙරෙන්නේ වර්ෂ 1959 අංක 6 දරන සේවක නිවාඩු පනතය.

## උපලේඛනය

### ආකෘතිය

6 වන රෙගුලාසිය

**1959 අංක 6 දරන සේවක නිවාඩු පනත**

10 වන වගන්තිය යටතේ දැන්වීමයි

........................................................................ **වෙතටයි.**

(ලිපිනය) :

ඔබ විසින් සේවයට ගනු ලැබූ .................................... නමැති සේවකයන්ට ............................ යෙදුණු ආණ්ඩුවේ නිවාඩු දිනය/දිනයන් සඳහා .................................... යෙදුණු ආණ්ඩුවේ නිවාඩු දිනය/දිනයන් වෙනුවෙන් වූ නිවාඩු දිනය/දිනයන් සඳහා වර්ෂ 1959 අංක 6 දරන සේවක නිවාඩු පනතේ විධිවිධානවලින් නියමිත පරිදි පාරිශ්‍රමිකය ගෙවීමට අපොහොසත් වීම පිළිබඳව ඔබට විරුද්ධව ............................ පවරා ඇති නඩුවෙහි දී ............................ වන මම පූර්වෝක්ත පනතේ 10 වන වගන්තියේ විධිවිධාන අනුව, මෙයට යා කොට ඇති උපලේඛනයේ I වන තීරයෙහි සඳහන්ව ඇත්තාවූත් ඔබ විසින් සේවයට ගනු ලැබූවාවූත් සේවකයන්ට එම උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනෙහි සඳහන් නිවාඩු දවස් වෙනුවෙන් පනත යටතේ නියමිත පරිදි පාරිශ්‍රමිකය ගෙවීමට ඔබ අපොහොසත් වූ බවට සාක්ෂි දීමට අදහස් කරන බව මෙයින් සලකා ගත යුතුය.

....................................

චෝදක

දිනය : වර්ෂ 196 ක්වූ ............................ මස ...... වන දින වූ මෙදින දී ය.

ස්ථානය :

උපලේඛනය

| I වන තීරය | II වන තීරය |
|---|---|
| සේවකයාගේ නම ... | පනතින් නියමිත පරිදි පාරිශ්‍රමිකය නොගෙවා ඇති නිවාඩු දිනයන්. |

7-13

## 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත

**1962 මාර්තු 29 වෙනි දින අංක ඇල්. ඩී—බී 17/58 දරණ (1958 සේවක අර්ථසාධක අරමුදල් රෙගුලාසිවලට කරන ලද සංශෝධන සම්බන්ධව) "1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත" යන වගන්තිය යටතේ 1962 මැයි 11 වන දින අංක 13,101 දරණ ගැසට් පත්‍රයේ 1 වැනි කොටසේ (1) වැනි ඡේදයේ 711, 712, 713 සහ 714 යන පිටුවල පළවී ඇති දැන්වීමේ වැරදි නිවැරදි කිරීමයි.**

"වර්ෂ 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනතේ 46 වන වගන්තියෙන් ලැබී ඇති බලය පිට කම්කරු හා ජනසතු සේවා පිළිබඳ ඇමතිවරයා විසින් සම්පාදිත නියෝගයයි" යන සියලුම වචන වෙනුවට "වර්ෂ 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනතේ 46 වන වගන්තියෙන් ලැබී ඇති බලය පිට කම්කරු හා ජනසතුසේවා පිළිබඳ ඇමතිවරයා විසින් සම්පාදිත උත්තර මන්ත්‍රී මණ්ඩලයෙන් සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයෙන් අනුමත කරන ලද නියෝගයයි" යන වචන යොදන්න.

වී. ඇස්. ඇම්. ද මෙල්,
ස්ථිර ලේකම්.
කම්කරු හා ජනසතුසේවා පිළිබඳ අමාත්‍යාංශය.

1962 ජූනි 28 දින.

7—106

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## අංක 21/62 දරන ආනයන පාලන දැන්වීම

### සිගරට් දුම්කොළ ආනයන

කවර රටකින් වුවද සිගරට් දුම්කොළ ආනයනට පෞද්ගලික ආනයන බලපත්‍රයක් දැන් අවශ්‍ය බව ආනයනකයන් වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ. මෙතෙක් සාමාන්‍ය ආනයන බලපත්‍ර මත කළ ආනයන මින් පසු ඉඩදෙනු නොලැබේ.

2. 1961 අවුරුද්ද තුළ ආනයනය කර ඇති සිගරට් දුම්කොළ ලේඛනයක් මෙම පාලනයට ඉදිරිපත් කිරීමට ආනයනකයන්ට මෙයින් දන්වනු ලැබේ. (1) රේගු සටහන් අංකය හා දිනය, (2) යාත්‍රාවේ නම හා සපැමිණි දිනය, (3) ප්‍රභවස්ථානය, (4) ප්‍රමාණය රාත්තල්, (5) රක්ෂණ, නැව් ගාස්තු ඇතුළු වටිනාකම රුපියල්වලින් යන කරුණු එම ලේඛනයට ඇතුළත් විය යුතු අතර රේගු මුද්‍රා සහිත සටහන් හා ඉන්වොයිස් ද ඇතුළත් විය යුතුය.

3. මෙම ලේඛනය ආනයනකයා විසින් සත්‍ය බවටත්, නිවැරදි බවටත් සහතික කළ යුතු අතර ඒවා මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 14ක් ඇතුළත මෙම පාලනයට ඉදිරිපත් කළ යුතු වේ. යම් වැරදි ප්‍රකාශයක් කර ඇති බැව් ඒත්තු ගියොත් තමාට හිමිවන ආනයන කොටස දීම ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

4. අදාල ආනයන බලපත්‍රයක් මෙම දෙපාර්තමේන්තුවෙන් ප්‍රථමයෙන් නොලබා කවර රටකින් හෝ මෙම බඩු ගෙන්වීම සඳහා ඇණවුම් කිරීම හෝ මෙදින සිට ඉතිරි ඇණවුම්වල බඩු නැව්ගත කිරීම හෝ නොකරන ලෙස ආනයනකයන්ට මෙයින් අවවාද කරමි. සියළුම ස්ථිර කළ නොනිමි ඇණවුම් සඳහා ආනයන බලපත්‍ර ඉල්ලුම් පත් මෙම දැන්වීම ගැසට් පතෙහි පළ වී දින 7ක් ඇතුළත ලිපිගත සාක්ෂිත් සමග මෙම පාලනයට ඉදිරිපත් කළ යුතුයි. (1) ඇණවුම් කළ දිනය, (2) ස්ථිර කළ දිනය, (3) ප්‍රභවස්ථානය, (4) ප්‍රමාණය රාත්තල් හා (5) රක්ෂණ, නැව් ගාස්තු ඇතුළු වටිනාකම රුපියල්වලින් යන කරුණු ද එම ඉල්ලුම් පත්වල ඇතුළත් විය යුතුය.

සී. මයිල්වාගනම්,
ආනයන හා අපනයන පාලක.

1962 ජූලි මස 3 වෙනි දින,
කොළඹ දීය.

7-248/3

## 1952 තිස්සමහරාම වන්දනා රෙගුලාසි

වර්ෂ 1952 ප්‍රකාශයට පමුණුවනලද තිස්සමහරාම වන්දනා රෙගුලාසිවල අංක 3 දරන රෙගුලාසිය අනුව හම්බන්තොට වැඩබලන ආණ්ඩුවේ ඒජන්ත තැන්පත් ඇස්. කදිර්කාමනාදන් වන මම පහත සඳහන් දිනයන් 1952 තිස්සමහරාම වන්දනා රෙගුලාසි බලපවත්වන කාල සමයක්වන බැව් මෙයින් ප්‍රකාශකරමි.

1962 ඇසළ උත්සවය

1962 ජූලි 2 දින සිට 19 වන දින දක්වා (දින දෙකම ඇතුලත්ව).

ඇස්. කදිර්කාමනාදන්,
හම්බන්තොට වැඩබලන ආණ්ඩුවේ ඒජන්ත තැන.

1962 ජූනි මස 27 වන දින,
හම්බන්තොට කච්චේරියේ දී ය.

7-68

## රථ වාහනවලට අවහිර

දකුණු කොට්ඨාශය — ගාලු දිස්ත්‍රික්කය

අක්මීමන-පින්නදූව පාරේ අංක 2/3 දරණ පාළම උඩින්
රථවාහන ධාවන මාර්ගය

ඉහත සඳහන් පාරේ අංක 2/3 දරණ පාළම කැඩී ඇති හෙයින් නව දුරටත් නිවේදනය කරන තෙක් එම මාර්ගය රථ වාහන සඳහා වසා තිබේ.

මේ හැරුණු විට ඇති අතිකුත් මාර්ගය ගාල්ල උඩුගම පාර හරහා කුරුඳුවත්ත මාර්ගයයි.

එච්. කේ. ඇම්. ප්‍රනාන්දු,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

ර. වැ. දෙ. ප්‍රධාන කාර්යාලය,
කොළඹ, 29. 6. 62.

7-99

**සැම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිඬ නිවාඩු දින අතරට පැමිණෙන සැම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.**

**ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).**

**ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායකමුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය.** **ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායකමුදල් භාරගනු නොලැබේ.**

දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන ගාස්තු

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ)

1. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරණු ලබන්නේ ප්‍රසිඬ කරන්නාගේ වගකීම පිටය.**

2. **පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.**

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද, සෙනසුරාදා දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30ට සහ සෙනසුරාද දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක් පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත පිටපත **කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිඬ කරනු නො ලැබේ.

10. 1962 ජූලි මස 16 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරණ ගාස්තු මෙසේයි :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට | ... ... | 10 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | ... ... | 110 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | ... ... | 220 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. **සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.** ප්‍රසිඬ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරණ දින සිට කාර්යාලය වැඩ කරණ දින හතරකට **ප්‍රථම පස්වරු 3.30 ට සියලුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ රජයේ** මුද්‍රණාලයේ **මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි. (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30ට ප්‍රථමයෙන්).**

13. දායක ගාස්තු :—

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට | | පිටරට |
|---|---|---|---|
| | රු. ශ. | | රු. ශ. |
| එක්කොටසක් ... ... .... | 22 50 | ... | 35 50 |
| I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 12 50 | ... | 18 0 |
| I වැනි කොටසේ ඡෙද දෙකක් ... ... | 20 0 | ... | 28 0 |

**වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නොඅඩු කාලයකට පමණය.**

**තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිල | | තැපැල් ගාස්තු මෙරට |
|---|---|---|---|
| | රු. ශ. | | රු. ශ. |
| (අ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුලත දී **එක කොටසක්** ... | 0 25 | ... | 0 20 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු, එක **කොටසක්** ... | 0 50 | ... | 0 20 |
| (ආ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුලත දී, **1 වැනි කොටසේ එක් ඡෙදයක්** ... | 0 10 | ... | 0 15 |
| ii. **ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු I වැනි** කොටසේ එක ඡෙදයක් ... ... | 0 20 | ... | 0 15 |

**දායක මුදල් බාරගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සලස්වන්න.**

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි " ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන් " හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි